NMSG Library

# යුද්ධයේ නින්දාව සහ අප මුහුණ දෙන අභියෝගය

එක්සත් ජනපදය සහ බ්‍රිතාන්‍ය දරුණු ආක්‍රමණයකින් පසු ඉරාකයට එරෙහි යුද්ධයේ ජයග්‍රහණය ප්‍රකාශ කර ඇත. එමෙන්ම කැත මැදිහත් වීමේ ක්‍රියාදාමය සිදුවේ. නමුත් ප්‍රශ්න, තර්ක හා විරෝධය ඉවත නොයයි. එහෙත් පොළවට සවිකල යකඩ උල් ඉතා උසය. ඉරාකයේ සිදුවෙමින් තිබෙන්නේ කුමක්ද? එය වටහා ගන්නේ කොහොමද? ඒ පිළිබඳව අපි කුමක් කරමුද? ග්‍රහලෝකය මත සෑම පුද්ගලයෙකුගේම අනාගතය කෙසේ වේද? අවදානම ඉතා ඉහලය.

යුද්ධය වැරදිය, ආක්‍රමණය වැරදිය, විරෝධය පෑම නිවැරදිය.

මෙම යුද්ධය ඉරාක ජනතාවට විමුක්තියවත්, විනාශකාරී අවි විනාශ කිරීමවත්, සැප්තැම්බර් 11 සිදුවීම් වැලැක්වීමටත් සම්බන්ධ නැති සත්‍යය දැනගත් ලෝකය පුරා දශලක්ෂ ගණන් ජනතාව එය නැවැත්වීම සඳහා විරෝධය පෑහ. ධවල මන්දිරය ඇතුලතින් ප්‍රකාශ වූයේ ''ඉරාකය ඉරාකයේ තරමට වැඩියි'' යන්නයි. එය අළුත් රෝම අධිරාජ්‍යයක සාහසික මතුවීම ''අපේ ආණ්ඩුව'' පෙන්නුම් කරයි. ඉරාකයේ ජනතාව සහ සම්පත් මත ආධිපත්‍යය පටවන අන්‍යයන්ගේ ලේමස් බුදින මංකොල්ලකාරී බල ව්‍යුහයක් ගොඩනගමින් සිටී. ලෝකය සහ මැද පෙරදිග නව ආකාරයකට තම බලය ක්‍රියාත්මක කිරීම සඳහා ඉරාකය හැර වීමට ඔවුන් ඉලක්ක කරති. 2002 දී RCP සභාපති බොබ් එවේකියන් ලියූ පරිදි ''ලෝක පරිමාණයකින් නැතිනම් එයටත් වඩා මැද පෙරදිග මධ්‍යම සහ දකුණු ආසියාවේ උපායික ප්‍රදේශවලත් ලෝකය සම්පූර්ණයෙන්මත් නැවත සකස් කිරීම ඔවුන්ගේ අභිප්‍රාය වෙති''.

## මෙම යුද්ධය ඉරාකයේ ජනතාවට කුමක් තේරුම් කරයිද?

ඔබ පසුගිය පුවත්පත් වල පිටු පෙරලා බැලුවහොත් බැග්ඩෑඩ් රෝහල්වල තුවාල ලැබූ මිනිසුන් හමු වේවි. ඇමෙරිකානු බෝම්බ ප්‍රහාරවලින් තම පවුලේ තරුණ දූවරුන් තිදෙනාම මියගිය බව කීමට බැරි මිනිසා හමු වේවි. ඔබට දස දෙනෙකුගේ (ඉරාක වැසියන්) මරණයන් ගැන දැක ගැනීමට ලැබේවි. අවුරුදු 5ට අඩු දරුවන් 5ක් මේ අතර සිටී. මේ අය කර්බාලා අසල ඇමෙරිකානු ආරක්ෂක මුරපොළකදී මරා දමා ඇත. ඇමෙරිකානු ක්‍රෲස් මිසයිල ප්‍රහාරවලින් මියගිය (බැග්ඩෑඩ් වෙළඳපොළ අසල) දුසිම් ගානක් මළ සිරුරු ගැන දැක ගැනීමට හැකි වේවි. මේ යුද්ධයෙන් දැනටමත් ඉරාක පුරවැසියන් දහස් ගණනක් මරා දමා ඇත. අංග විකල කර ඇත.

ඇමෙරිකානු සහ බ්‍රිතාන්‍ය මියගිය භටයින් පිළිබඳ කතාව කෙසේද? මියගිය භටයකු වන මැරීන් ජේසුන්ගේ පියා වන සුආරිස් සේල් සෝලාර් ''මේවා බුෂ්ගෙ තෙල් සඳහා'' ලෙස පත්‍ර වාර්තාකාරයෙකුට කියා තිබිණ. ඔවුන්ගේ මිනී තවත් තත්ත්වය උග්‍ර කරයි. තරුණ පිරිමි සහ ගැහැණු ප්‍රජාතන්ත්‍රවාදයේ නාමයෙන් දුප්පත් රටක ජනතාවට එරෙහි මෘග තිරිසනෙකු ආක්‍රමණිකයෙකු බවට පරිවර්තනය කරයි. ඇත්තෙන්ම මෙහි යුක්තියක් තිබේද?

ආක්‍රමණිකයන්ට විමුක්තිදායකයින් විය නොහැක.

මෙම ආක්‍රමණ දෙස බලන්න. එහි පළමු සතිය තුළ ගිණිබත් වූ රෝහල් වටා බරපතල තුවාල ලද ජනතාව රොක්වුහ. වෛද්‍යවරුන්ට පිරිසිදු ජලය හෝ නිර්වින්දන පවා නැතිව බරපතල ශල්‍යකර්ම සහ අවයව කපාදමන්නට සිදු විය. ඇමෙරිකාව බෝම්බ දැමීමෙන් ඉරාක ජනතාවට විදුලිය, ජලය ආහාර සෑම දෙයක්ම අහිමිකර තිබුණි. මේවා කාගේ අධිකාරය පෙන්වන්ට කලේද?

ඉරාක ජාතික කෞතුකාගාරය පෙර මිනිස් ශිෂ්ඨාචාරයේ උතුම් ස්ථාන සමතලා කර තිබුණි. ජාතික පුස්තකාලය ගිණිබත් කර තිබුණි. මෙහිදී අනාරක්ෂිත වූ පොදු ජනයාගේ ඉතා වටිනා ඓතිහාසික ලියවිලි දුම් වළළු වී ඉහලට නැගුණි. එහෙත් එක් ස්ථානයක් ආරක්ෂාකාරීව පැවැතුණි. එක් ඉරාක මිනිසෙක් (කෝපයෙන්) නිව්යෝර්ක් ටයිම්ස් පත්‍රයට කියා තිබුණේ ''තෙල් පිළිබඳ වූ අමාත්‍යාංශය ආරක්ෂාකර තිබුණ බව. ඇමෙරිකාවට එය විතරක් ආරක්ෂා කර ගැනීමට අවශ්‍යවෙලා තිබුණ බව''.

මේ අතර ඇමෙරිකානු සෙබලුන් විසින් නොතේරෙන භාෂාවකින් ඉරාක වැසියන්ට නවතින්ට දුන් නියෝග නොසලකා හැරීම මත ඉරාක වැසියන්ව මරා දමමින් සිටිති. ඇමෙරිකානු යුධ හමුදාවේ සදාම් හුසේන්ගේ පරණ පොලිස් බලකායක් වීදි ආරක්ෂා කරන්ට ගෙනවිත් ඇත. අප්‍රේල් 14 වෙනිදා ''මෙසාල්'' වල දේශපාලන විරෝධතාවන් දැක්වූ ජනයාගෙන් 13 දෙනෙකු මරා දැමීය. දකුණු මධ්‍යම ලොස් ඇන්ජලීස් වලින් බැග්ඩෑඩයට සහ මෙසාල්වල බටහිර ඉවුරට හමුදාව ගෙනවිත් ඇත. පදිංචි කර ඇත. දැන් ඇමෙරිකානු හමුදා ප්‍රධානීන් ''ඉරාකයට ප්‍රජාතන්ත්‍රවාදය ගෙනෙන'' සම්මන්ත්‍රණ පවත්වති.

ඇමෙරිකන් හමුදාවේ තුවක්කු යටතේ යම්කිසි මැතිවරණයක් පවත්වාවි.

''විමුක්තියේ නාමයෙන්'' අමෙරිකානු එක්සත් ජනපදය ඉරාක ජනතාවගේ ස්වාධීනත්වය බලහත්කාරයෙන් යටපත් කර ඇත. එම ජනතාවට අපහාස කර ඇත. ඉරාක ජාතිකයන්ගේ සංස්කෘතිය පාගා පොඩි පට්ටම් කර ඇත. එහෙත් ඇමෙරිකන් ආණ්ඩුවෙන් විමුක්තිය ලගා නොවෙයි. එක්සත් ජාතීන්ගෙන්ද ලගා නොවෙයි. ඉරාක ජනතාව

විරෝධය පෑම් ඔස්සේ යම් දිනක ප්‍රජාතන්ත්‍රවාදය, සැබෑ ස්වයංතීරණය දිනා ගනීවි. දැනටත් විරෝධය ගොඩනැගෙමින් පවතී.

අපි කොයිම ආකාරයකින්වත් මේ ආක්‍රමණිකයන්ට සහය නොදිය යුතුය. අපි එහි ''අභිවෘද්ධිය'' යන ප්‍රයෝගයන්ට හසු නොවිය යුතුය. බ්‍රිතාන්‍ය සහ ඇමෙරිකන් ආක්‍රමණිකයන් ඉරාකයෙන් ඉවත් වෙයවි ඉල්ලමින් ලෝකය පුරා අනිත් අය සමග අපි එක්විය යුතුය. මේ ආක්‍රමණිකයන්ට එරෙහි විරෝධය අපි පිළිගත යුතුය. විශේෂයෙන්ම ඉරාක ජනතාවගේ බිම් මට්ටමෙන් එන විරෝධයට සහ ඔවුන්ගේ විමුක්තිය සඳහා පෙනී සිටින සැබෑ බලවේගයන්ට උදවු කළ යුතුය.

**වෙනස් අනාගතයන් දෙකක්**
**වෙනස් මාවත් දෙකක්**

''දේවල් වේගයෙන් වෙනස් වේවි. අප දන්නා ඇමෙරිකාවේ තවදුරටත් ඒ අයුරින්ම නොපවතිනු ඇත.'' (බොබ් එවේකියන් - සභාපති විප්ලවීය ඇමෙරිකන් කොමියුනිස්ට් පක්ෂය)

සාමාන්‍ය තත්ත්වය කරා යාමක් නැත. ''ඊළඟට කොහාටද?'' බුෂ්ගේ මහජන කථාවේ ඇත. ''බුෂ්ගේ ක්‍රියාමාර්ගය'' අභියෝගයන්ට සහ බොහෝ ප්‍රශ්ණවලට මුහුණ දෙමින් ආර්ථිකමය, දේශපාලනමය යුධමය සුපිරිභාවය අත්පත් කර ගැනීමයි. ස්ථිර යුද්ධයක් සඳහා සූදානම් වෙමු.

මේ සමග ආරක්ෂාවේ නාමයෙන් සිවිල් නිදහස සීමා කිරීමේ සහ පිටපත් කිරීමේ වැඩ පිළිවෙලක් එයි. ඇස්ක්‍රොප්ට්ගේ නීති දෙපාර්තමේන්තුව සංක්‍රමිකයන්ව ගොදුරු කරගෙන ඇත. ''වරදකරු බවට ඔප්පු වන තුරු නිර්දෝෂී'' බව ඉවත දමමින් සංක්‍රමිකයන් තාඩන පීඩනවලට ලක්කර ඇත. නව නීති, දේශපාලන සහ ආගමික කණ්ඩායම් වලට වැදීමට බලතල රජය ලබාදී ඇත. නිවෙස්වල දුරකතන වලට රහසිගතව සවන් දෙයි. නිවෙස් පරීක්ෂා කිරීම, කාර්යාල පරීක්ෂා කිරීම මිනිසුන්ගේ අන්තර් ජාලයන් පරීක්ෂා කිරීම, පුස්තකාල පරීක්ෂාවන්ටද බලතල ලබාදී ඇත.

මෙය ඉතා දුෂ්කර කාලයකි. එමෙන්ම බලාපොරොත්තු සහගත කාලයක්ද වෙයි. එය උසස් බලාපොරොත්තු වේ. මේ රටේ බහුතර ජනතාව යටපත් කිරීම ඇතුළුව බුෂ්ගේ දැවැන්ත ප්‍රහාර මෙම පෘථිවිග්‍රහයාගේ ජනතාවගේ කැමැත්තට එරෙහිව යාම සරල සත්‍යයයි. ඒ සමගම බහුතර ජනතාව රටවල් තුළම බියට හා සැකයට පත්කිරීමයි. මේ පීඩාකාරී දරුණු සැලැස්මට එරෙහිව ජනතාවගේ කෝප සහගත විරෝධය දහස් ගණන් ජනතාව ලක්ෂ ගණන් දශලක්ෂ ගණන් වී ලෝකය පුරාම පැවැත් විය.

මේ ශක්තිමත් විරෝධයට යුද්ධය නවත්වන්නට පුළුවන් නොවීය. නමුත් ඇමෙරිකාවේ සිටින දශලක්ෂ ගණන් ජනතාව ඔවුන්ගේ ආණ්ඩුව හෙලා දැක ඇත. ඇමෙරිකාවේ ජනතාව ග්‍රහලෝකයේ අනෙකුත් ජනතාව සමග උරෙන් උර නැගී සිටිමින් ලෝකයට කියන්ට ''මේ සියල්ල අපේ නාමයෙන් නොවේ'' යයි ඉදිරිපත් විය.

ඇමෙරිකන් අධිරාජ්‍යවාදීන් ඔවුන්ගේ මිලිටරි යන්ත්‍රය පිළිබඳ පුරසාරම් දොඩවමින් උඩගුව සිටිති. එහෙත් ඔවුන් දේශපාලනිකව හුදෙකලා වී ඇත. ලෝකය පුරා පිළිකුලට, වෛරයට භාජනය වී ඇත.

අනාගතයේ ජීවත්වීමේ වටිනාකම කැටයම් කිරීම ලෝක ජනතාවට අයිති කටයුත්තකි.

## එක අතකින් යුද්ධය සහ විප්ලවයේ අවශ්‍යතාව

විරෝධය දෙස බැලීමේදී එය ලෝකය පුරා පවත්වා ඇත. අද අපි කොටුවී සිටින තැති ගැන්ම සහ උමතුවට වඩා මනුෂ්‍යත්වය එය බව පැහැදිලි නැතිද?

ජනතාව ධෛර්යමත් ලෙස පරිත්‍යාග කරන්නේ කුමක්ද? ඔවුන්ට කවදාවත් හමු වී නැති සැතපුම් දහස් ගනනක් ඈත ජනතාව වෙනුවෙන් පුද්ගලික ආරක්ෂාව අවදානමට ලක්කර ගනිමින් යහපත් සමාජයක් සඳහා නැගූ හඬයි. පීඩාකාරීව ජීවත් වීමට වඩා එයට එරෙහි වීම නොවටිද?

## විද්‍යාව හා තාක්ෂණය කුමකටද?

බංකර් ගොඩ නැගීමට, බ්ලැක් හෝක්ස් ගුවන්යානා තැනීමට සහ ඔත්තු බලනවාට වඩා, ජනතාව වහල්භාවයට පත්කිරීමට සහ ලාභ ඉපයීමට වඩා පෘථිවිය විනාශ නොකර ශක්ති සම්පත් වර්ධනය කරමින් වෛද්‍ය ප්‍රශ්ණ විසඳීමට විද්‍යාව හා තාක්ෂණය යෙදවිය යුතු බවය.

මෘග අමානුෂික පාලනයකට යටත්ව සිටින ජනතාවට විදේශ මැදිහත්වීම් නැති කාටවත් ගැති නොවන ඔවුන්ගේම සමාජයක් ගොඩනැගීමට බලය ඇත්නම් කෙසේ වේද?

''විප්ලවීය කොමියුනිස්ට් පක්ෂය හැටියට අපේ පැත්තෙන් අපි විශ්වාස කරන්නේ වඩා හොඳ ලෝකයක් ගොඩනැගීමට හැකියාවක් ඇතැයි යන්න පමණක් නොව එය ගොඩනගන ලෙස කෑගසා අපෙන් ඉල්ලා සිටින බවය''

අපේ විරෝධය ගොඩනැගීමට අප දශලක්ෂ ගණන් ජනතාව සමග එක්වන විට, අප එලෙස කරනුයේ මෙම දැක්ම හඳුනා ගනිමින් එය තේරුම් ගිනිමිනි. ඇත්තටම සමාජය පරිවර්තනය කල හැක්කේ නිර්ධන පංති විප්ලවයකින් පමණකි. මෙම විප්ලවය සියළුම අධිරාජ්‍යවාදී කඳවුරු ඉලක්ක කරගත යුතුය. සියළුම ආකාරයේ සූරාකෑම් සහ පීඩාවන් සියළුම වහල් යදම් ඉලක්ක කර ගත යුතුය.

ඇමෙරිකාවේ සම්පූර්ණ ඉතිහාසයම අපට උගන්වනුයේ මෙම ධනපති අධිරාජ්‍යවාදී පංතිය බලය හොබවනතාක් ඔවුන් ජනතාව අසාධාරණ යුද්ධය සඳහා ගෙන යන බවයි.

පෙර නොවූ විරූ හමුදා බලයකින් නියෝග දෙන අධිරාජ්‍ය ගොඩනගන කපටි නීතිවිරෝධී කල්ලියක් ස්ථාපිත වී තිබෙන ක්‍රමයක් බව අපි දැන් සාක්ෂි ඇතිව දකින්නෙමු. ලෝකයේම පාලනය අත්කර ගැනීමට ඓතිහාසික අවස්ථාවක් ලෙස ඔවුන් දකියි. ඔවුන්ව වැලැක්වීම, එම කාර්යෙන් ඔවුන්ව ඉවත් කිරීමයි. ශ්‍රේෂ්ඨ අරගලයකින් සහ කැපකිරීමකින් ඔවුන්ව පරාජය කිරීමයි.

එමනිසා අපගේ විරෝධය ශක්තිමත්ව ගොඩනැගීම අවශ්‍යයි. එය මෙම යුධ යන්ත්‍රය නැවැත්වීම ඉලක්ක විය යුතුය. නමුත් අපි එය හොඳ අවබෝධයකින් කළ යුතුය. එසේ නැත්නම් පරණ සූරාකෑමේ ක්‍රමය සුණු විසුණු කර බහුජනතාවට අළුත් විප්ලවීය බලය ස්ථාපිත කරන්නට අවශ්‍ය මොහොතේදී මෙම පවත්නා ක්‍රමය බහුජනතාවට පීඩනය මර්ධනය ගෙන එනු ඇත. ආපසු හරවනු ඇත.

2003 මැයි 01 වනදා අප සමග එක්වන ලෙසට ඔබට ආයාචනා කරන්නෙමු. අපට දිනා ගන්නට ලෝකයක් ඇති බව අපේ ප්‍රතිපත්තිය තුළින් ක්‍රියාත්මක කරමු. ආදරණීය මාර්ගයට අවතීර්ණ වෙමු. ජයග්‍රහණය ලබමු.

**මාක්ස්වාදි අධ්‍යයන කණ්ඩායමේ පරිවර්තනයකි**
**(2003 මැයි 01)**

http://slmarxist.yolasite.com
slmarxist@ymail.com